04

ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය

මානවශාස්ත්‍ර හා සමාජීයවිද්‍යා පීඨය

ශාස්ත්‍රවේදී උපාධි තෙවන වසර ප්‍රථම අර්ධ වාර්ෂික පරීක්ෂණය - 2019 අගෝස්තු/සැප්තැම්බර්

ආර්ථික විද්‍යාව

**ECON 3141.03/3141.03 - නීතිය හා ආර්ථික විද්‍යාව**

කාලය පැය තුන (03) යි

---

මෙම ප්‍රශ්න පත්‍රයට ලකුණු 75 ක් ලැබේ.

ප්‍රශ්න පත්‍රය **I, II, III, IV,** හා **V** ආදී වශයෙන් කොටස් පහකින් යුක්තය.

ප්‍රශ්න පත්‍රය තෝරා ගැනීම පිළිබඳ උපදෙස් එක් එක් කොටස යටතේ දී ඇත.

---

**I** කොටස පහත සඳහන් ඒවා අතුරින් ඕනෑම **පහක්** (05) නිර්වචනය කරන්න.

(ලකුණු 10)

1. (අ) ලීනය (ඒකාබද්ධය) (ආ) අපරාධ

(ඇ) පෞද්ගලික නීතිය (ඈ) නීතියේ රීතිය

(ඉ) ව්‍යවස්ථාදානය (ඊ) ව්‍යවස්ථාකරණය (Constitutionalism)

(උ) සංස්ථිතික දේශපාලනික ආර්ථිකය

2. **II** කොටස පහත සඳහන් පද/සංකල්ප යුගලයන්ගෙන් ඕනෑම **පහක** (05) වෙනස්කම් පැහැදිලි කරන්න. **(ලකුණු 10)**

(අ) සමාජ අයිතිවාසිකම් හා ආර්ථික අයිතිවාසිකම්

(ආ) සදාචාරය හා ගෞරවය

(ඇ) ද්වේශ සහගත හැරයාම හා අනුමිත ද්වේශ සහගත හැරයාම

(ඈ) අපරාධ හා චේතනාව

(ඉ) අපරාධ හා සංක්‍රාම

(ඊ) ස්ත්‍රී දූෂණය හා වෛවාහික ස්ත්‍රී දූෂණය

3. **III** කොටස පහත සඳහන් වචන යුගලයන්ගෙන් ඕනෑම **පහක** (05) සම්බන්ධතා පැහැදිලි කරන්න. **(ලකුණු 10)**

අ. විවාහය හා ගිවිසුම

ආ. නඩු තීරණ හා ලිඛිත නීතිය

ඇ. හරවත් නීතිය හා පටිපාටිය නීතිය

ඈ. දඬය හා සිරගත කිරීම

ඉ. දිස්ත්‍රික් අධිකරණය හා මහේස්ත්‍රාත් අධිකරණය

ඊ. මානව හිමිකම් හා මූලික අයිතිවාසිකම්

4. **IV** කොටස කෙටි පිළිතුරු ප්‍රශ්න. ඕනෑම ප්‍රශ්න පහකට (05) පිළිතුරු සපයන්න.

(ලකුණු 25)

4.1. රාජ්‍යය නීතියෙහි උපකාණ්ඩ මොනවාද? (ලකුණු 05)

4.2 නීතිය ආණ්ඩුවෙන් සපයනු ලබන්නේ ඇයි? කෙටියෙන් පැහැදිලි කරන්න.

(ලකුණු 05)

4.3 ශ්‍රේෂ්ඨාධිකරණය සතු බලතල මොනවාද? (ලකුණු 05)

4.4 බුද්ධිමය දේපොල අයිතිය කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 05)

4.5 ව්‍යවහාර නීතියෙහි කොටස් පහ මොනවාද? (ලකුණු 05)

4.6 නීතිය හා ආර්ථික විද්‍යාව විෂයයක් වශයෙන් දියුණු වූ ආකාරය කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 05)

5. **V** කොටස විශ්ලේෂණාත්මක ප්‍රශ්න ඕනෑම ප්‍රශ්න දෙකකට (02) පිළිතුරු සපයන්න.

(ලකුණු 20)

5.1 පාරිභෝගික ආරක්ෂණ අධිකාරිය ශ්‍රී ලංකාවේ වෙළෙඳපොළෙහි තරගය ප්‍රවර්ධනය කිරීමෙහිලා කෙතරම් දුරට උපකාරී වී ඇත්ද? විග්‍රහ කරන්න.

(ලකුණු 10)

5.2 අපරාධකරුවන්ට දඬුවම් කිරීමේ අරමුණු මොනවාද? පැහැදිලි කරන්න.

(ලකුණු 10)

5.3 අපරාධ අනුපාතය අඩු කිරීම සඳහා අනුගමනය කළ හැකි උපායමාර්ග මොනවාද? පැහැදිලි කරන්න.

(ලකුණු 10)

5.4 මානව හිමිකම්වල ආර්ථික වටිනාකම කුමක්ද? පැහැදිලි කරන්න.

(ලකුණු 10)

************